සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම - 2018
,உணஷலஹகஷ ஜட_இண கஜபகஷகப்ல் - 2018
Second Term Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 10 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper III | පැය / மணித்தியாலம் / Hours 02 |

නම
நகஅஉஷ ----------------------------------------
Name

සැලකිය යුතුය

- උපදෙස් දී ඇති පරිදි **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුර සපයන්න.
- **1,2,3,4** ප්‍රශ්නවලටත් **5,6,7** ප්‍රශ්නවලින් **එකකටත්** පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80** කි.

(01) අංක (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. **කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) ''මේ වේදේහ රජහුගේ බලයෙක් නො වෙයි''

(අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දක් ද?

(ආ) එය අසා සිටි අයගේ නම ලියන්න.

(ii) (අ) බැද්දේගම නවකතාව සඳහා පාදක වූ දිස්ත්‍රික්කය කුමක් ද?

(ආ) පෙළ පොතෙහි බැද්දේගම පාඩම ලෙස දක්වා ඇත්තේ නවකතාවේ කීවෙනි පරිච්ඡේදය ද?

(iii) (අ) කෙළි සෙල්ලම් ඇසුරෙන් සකස් වූ ජනකවි වර්ගයක් සඳහන් කරන්න.

(ආ) ඇස නැති දා පොත ගත්තේ කියන්ට ද
දත නැති දා උක් දඬු ගිනි තපින්න ද
වෙර නැති දා ගහගත්තේ දිනන්න ද
----------------------------------------

මෙහි අවසන් කවි පදය සම්පූර්ණ කරන්න

(iv) කන් කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ
රන් රසු දල් කොලහල වන බියෙනේ
සන් සල නොව එහි පිළි රූ ලෙසිනේ
නන් හය සෙන් සිටියෝ සිටි මතිනේ

(අ) මෙහි සඳහන් උපමාව හා උපමේය වෙන් කොට ලියන්න.

(ආ) ඉහත පද්‍යයෙන් කියවෙන පිරිස බිය වීමට හේතුව කුමක් ද?

(v) (අ) වානරයා, වන සරණ යන කෘති සිංහලට පරිවර්තනය කළේ කවුරුන් විසින් ද?

(ආ) ''කොටියාගේ පැටියා මුවෙක් වෙලා'' මෙම ප්‍රකාශයෙහි 'මුවෙකු' ලෙස හඳුන්වා ඇත්තේ කවුරුන් ද?

(vi) (අ) උපදේශාත්මක ජනකවි හැඳින්වෙන වෙනත් නමක් ලියන්න.

(ආ) 'තමන්ගේ තරම දැනගෙන කල් හරිනු' යන්නට ගැළපෙන පිරුළක් ලියන්න.

(vii) (අ) පන්සිය පනස් ජාතක පොත ඇසුරෙන් බිහි වූ සිවුපද කාව්‍ය ග්‍රන්ථ දෙකක් දක්වන්න.

(ආ) ජාතක කතා ඇසුරෙන් රචිත ගී කාව්‍ය දෙකක් දක්වන්න.

(viii) (අ) අනුවණකම් කෙළේ
ගුරුන් ගුණ සිහි නො කෙළේ
නද ඉන් නො පතළේ
----------------------------------------------

ඉහත කවියේ අවසන් කවි පාදය සම්පූර්ණ කරන්න.

(ආ) එම කවියෙන් කියවෙන පරිදි අනුවණකම් කළ අයගේ නම ලියන්න.

(ix) වරද පෙනෙන තරමට වැරදුණා නොවේ
වරද ඇතත් නිකරුණේ වැඩ කළා නොවේ
වරද පෙනෙති වැඩ නූගත් අයට ලොවේ
වරද නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ

(අ) මෙහි සඳහන් පොදු මිනිස් දුබලතාවක් දක්වන්න.

(ආ) 'සකිය' යන්නෙහි අර්ථය ලියන්න.

(x) (අ) 'ද විලේජ් ඉන් ද ජන්ගල් ' කෘතියේ රචකයා කිනම් ජාතිකයෙක් ද?

(ආ) පරමන්ත ජෝතිකාව නම් කෘතිය රචනා වූ යුගය ලියන්න.

(ලකුණු 2×10 =20)

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) ''ලෙඩට බෙහෙත් කොච්චර තිබුණත් කරුමෙට බෙහෙත් තියෙනවා යැ''?

(අ) ඉහත ප්‍රකාශය කරන ලද්දේ කවරෙකු විසින් ද?

(ආ) එය කුමන අවස්ථාවක කරන ලද ප්‍රකාශයක් ද?

(ii) ''පවුරු මුදුනේ ඉතා නිල් වැ අර මේ පෙනෙන්නේ කිම්දැ''

(අ) ඉහත දැක්වෙන්නේ කවරෙකු හට කළ ප්‍රකාශයක් ද?

(ආ) මෙහි සඳහන් 'නිල් ' වර්ණයෙන් පෙනෙන දෙය කුමක් ද?

papers.lk

(iii) යටැසින් ලන බැල්මෙන් සුර **විලසී**

වෙසෙසින් දන මන මත් කැර එකසී

අහසින් බැස **රඟ** ගත් රඟ කෙලෙසී

දිසි මෙන් විය විදුලිය සිය දහසී

(අ) අංකිත පදවල අර්ථ දක්වන්න.

(ආ) කවියේ අදහස සරල බසින් ලියන්න.

(iv) **රන් විමනේ** සිටි මුත් දුක නැති වෙද්ද

පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද

**මිණි බරණින්** සැදූ මුත් ගත නොදිරද්ද

පැණිවරකා ගසටත් හෙණ නොවදිද්ද

(අ) ඉහත පද්‍යයෙන් ඉදිරිපත් කරන ජීවිතයේ ස්වභාවය කෙබඳු දැයි කෙටියෙන් ලියන්න.

(ආ) අංකිත පදවල අර්ථ දක්වන්න.

(v) කේවට්ටයා අසු නැඟී, කටින් ලේ දම-දමා තළලේ ලේ පිස-පිස දිවෙන්නේය; සේනාවට ආසන්න ව අස් පිට ම හිඳ ''පින්වත්නි,'' නො යව;

(අ) ඉහත ප්‍රකාශයෙන් කේවට්ටයාගේ චරිත ලක්‍ෂණයක් මතු කර දක්වන්න.

(ආ) එහි සඳහන් භාෂා ලක්‍ෂණයක් ලියා දක්වන්න.

(ලකුණු 4×5 =20)

- 03 සහ 04 ප්‍රශ්නවලට වචන 150 - 200 අතර විය යුතුය.

(03) බැද්දේගම නවකතාවෙන් ගැමියන්ගේ

(i) නූගත්කමත්

(ii) දුප්පත්කමත්

මතු කිරීමට කතුවරයා සමත් වී ඇත.එක් කොටසකට නිදසුන් දෙක බැගින් දක්වමින් තහවුරු කරන්න.

(ලකුණු 15 යි)

නැතහොත්

රාජ්‍ය පාලන කටයුතුවල දී අග්‍ර පුරෝහිතයන් ලෙස රාජ්‍ය පාලකයාට දක්වන සහයෝගය

(i) මහෞෂධ පණ්ඩිතයන්ගේ චරිතය

(ii) කේවට්ට බමුණාගේ චරිතය

ඇසුරෙන් එක් චරිතයකට උදාහරණ දෙක බැගින් දක්වමින් අගය කරන්න.

papers.lk

(ලකුණු 15 යි)

(04) ජන හද ඇඳ බැඳ තබා ගැනීමට

(i) ශබ්දාලංකාර හා

(ii) අර්ථාලංකාර යොදා ගැනීමට

ජන කවියා සමත් වී ඇති අයුරු 'හානා හීය පානා අඬහැරෙන් දනේ ' පාඩම ඇසුරෙන් එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

නැතහොත්

ගුත්තිල කාව්‍යය රසවත් නිර්මාණයක් වීමට එහි උපයුක්ත

(i) සරල බස් වහරත්

(ii) වියත් වහරත් හේතු වී ඇත

එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15 යි)

- 05, 06, 07 ප්‍රශ්නවලින් එකකට උත්තර සපයන්න.
  වචන 120 - 150 ක් අතර විය යුතු ය.

(05) ජීවිතයේ මුහුණ දීමට සිදු වන ගැටලුකාරී අවස්ථාවල දී උපදෙස් ලබා දීමට ජන කවිය සමත් වී ඇත. 'හානා හීය පානා අඬහැරෙන් දනේ ' පද්‍ය පන්තියෙන් නිදසුන් තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

(06) 'වනය නිරන්තරයෙන් ම බියකරු බව රැදෙන අමුතු ම තැනකි ' බද්දේගම නවකතාවෙන් නිදසුන් තුනක්වත් දෙමින් මේ කියමන සනාථ කරන්න.

(ලකුණු 10 යි)

(07) අවස්ථාවට උචිත ලෙස උපමා භාවිත කිරීමට ජාතක කතාකරු සමත් වී ඇති අයුරු 'සතරකන් මන්ත්‍රණය' පාඩම ඇසුරෙන් නිදසුන් තුනක්වත් දෙමින් විමසන්න.

(ලකුණු 10 යි)

papers.lk